මදක් පසුබස්සන්නට සමත් වූවා සේ ය. ඔහු මොහොතක් කල්පනා කරමින් සිටියේ ය.

''හොටෙල් එකට ගිහින් කෝල් එකක් දෙමු..'' ඔහු කීවේ ය.

නිෂාධි නිහ්ශබ්ද වූවා ය. ඔහුගේ ඒ තීරණය අවසන් තීරණය බව ඇය දැන සිටියා ය. ඔහු සමඟ තවත් වාද කිරීමෙන් පළක් නැත. නිෂාධි දෑස් පියාගත්වන ම කල්පනාවට වැටුණා ය. බොහෝ දුර යන සිත නැවතෙන්නේ අනුරාධ අසළ ම ය. මේ තරම් ඉක්මනින් මේ තරම් අනපේක්ෂිත ලෙස ඔහුගෙන් වෙන්වන්නට වීම දරාගත නොහැකි කණගාටුවකි.

''අපි හෙට ගෙදර ගිහින් අම්මලටත් කියලා ඔයාගෙ ඇඳුම් බෑග් ටික අරගෙන එමු...'' නිෂාධිගේ කල්පනාව බිඳ දමමින් දිලීප කීවේ ය.
''නෑ.. ඕනෙ නැහැ.. මොකටද...?'' නිෂාධි කීවේ නුරුස්නා ස්වරයකිනි. දිලීප සිනා සී ඇය දෙස බැලුවේ ය.

''තරහා ගිහිල්ලා වගෙයි.. ලංකාවෙ රස්නෙට මිනිස්සුන්ට හරියට තරහා යනවා..'' ඔහු සිනාසෙන්නට උත්සාහ කළේ ය.

නිෂාධි රිය කවුළුවෙන් ඉවත බලා සිටියා විනා යමක් කියන්නට උත්සාහ නොකළා ය. නිහ්ශබ්දව සිටීම වඩා යහපත් ය.

0000000

පවිත්‍රාගේ දුරකතනයට සම්බන්ධ වන්නට අනුරාධ කීප වතාවක් උත්සාහ කරන්නට සිදුවිය.
''නිෂාධිගෙ ටිකට් කප්පවාගෙන ගිහින්..'' ඔහු කීවේ ය.

''මං දැනගත්තා''පවිත්‍රා කීවා ය.

''දැන් කෝ එයා...?'' අනුරාධගේ අප්‍රාණික කටහඬ ඔහු කෙරෙහි පවිත්‍රා ගේ සිතේ ඇති කළේ කණගාටුවකි. රටක් ආදරය කරන මේ රංගන ශිල්පියා ආදරය වෙනුවෙන් හඬා වැටෙන තරම.

''කලබල වෙන්න එපා අනුරාධ..'' පවිත්‍රා කීවා ය ''..ඔයාට එයා මුණ ගැහෙන්න ලැබෙන එකක් නැහැ...''

''මං කොහොම හරි මුණ ගැහෙන්නං... මට කියන්න... එයා කොහෙද දැන් ඉන්නෙ..?'' අනුරාධ නැවත ඇසුවේ ය.

''හොටෙල් එකේ.. මම හිතන්නෙ නෑ එතනට ගිහින් ඔයාට නිෂාධි මුණ ගැහෙන්න පුලුවන් වෙයි කියලා..''

''..''

''අනුරාධ... මේ අහන්න... එයාලා සෙන-සුරාදා රෑ ආපහු යනවා.. ෆ්ලයිට් එක රෑ දොළහට.. දැන් කලබල වෙලා කරන්න දෙයක් නැහැ.. ඉවසන්න.. හෙට දවස අදට වඩා හොඳ වෙයි.''

අනුරාධ සුසුමක් හෙලනු දුරකතනය තුලින් පවිත්‍රාට පැහැදිලිව ඇසුණි.

''මං කියන දේ අහන්න... දුක් වෙන්න එපා.. කලබල වෙන්නත් එපා.. හැම දේම හොඳින් සිදුවේවි.. අද දවස ඔය විදිහට ඉවර වෙන්න ඉඩ දෙන්න.. හෙට අලුත් දවසක් එනවනෙ..'' පවිත්‍රා කීවා ය. කිසිවක් නොකියා තත්පර කීපයක් ගත කළ අනුරාධ දුරකතනය විසන්ධි කරනු පවිත්‍රාට ඇසුණි.

00000000

දිලීප වාහනය පදවමින් සිටියේ සියලු රියදුරන්ට සිතෙන් බණිමිනි.

''මේ යක්කුන්ට මාර්ග නීති කියලා දෙන්නැද්ද මන්දා මේ රටේ.. '' ඔහු වරෙක සිය අප්‍රසාදය පිට කළේ ය. ''ප-ිස්සො වගේ එලවන්නෙ..''
නිෂාධි ඔහු හා කතාවට නොගියා ය.

''මේ රට කවදාවත් හැදෙන රටක් නෙවෙයි.. එක අතකින් ඔස්ට්‍රේලියාවට වෙලා ඉන්න එක කොයි තරම් සහනයක් ද..? මම නම් ආයෙ කවදාවත් මේ අපායට නම් එන්නෙ නැහැ..'' දිලීප නැවත කියයි. වසර ගණනාවක් පිටරට සිටි විදෙස්ගත මානසිකත්වයෙන් යුතු දිලීප මෙසේ සිතීම නිෂාධිට පුදුමයක් නොවේ.

යමක් කියන්නට නිෂාධිගේ මුව පොපියයි.

''ඒ රන් කූඩුවට වඩා මේ මහ පොළොව මට සැපයි..'' ඇයට කියන්නට අවශ්‍යව තිබුණේ එය වුව ද ඒ සියල්ල සිත තුළ ම තැන්පත් කර ගනිමින් ඈ නිහඬව ම ඈත බලා සිටියා ය. ඈ මහ ගෙදරට එන තෙක්ම එකම වචනයක් හෝ නො-දෙඩුවා ය.

*සඳු නැගෙන යාමයේ*
*පිපුණු මල් හිනැහුණේ*
*තරු දිලෙන ආකහේ*
*නුඹේ රුව මට පෙනේ*
*යදම් බැඳි මායිමේ*
*කඩා ඉහිරෙන දිනේ*
*හමා එම් මඳනලේ*
*සසර විඳි සුව දැනේ*

''මට ආරංචි වුණා ටිකට් කපාගෙන ආවය කියලා..'' තාත්තා කතා කළේ අසතුටෙන් බව නිෂාධි තේරුම් ගත්තා ය.

දිලීප එයට පිලිතුරක් ලෙස කිසිවක් නොකීවේ ය.
''මම පැයකින් එන්නම්.. ලෑස්ති වෙලා ඉන්න..'' ඔහු නැවත වාහනයට නගින අතර කීවේ නිෂාධිට ඇසෙන සේ ය.



''ඇයි.. මිනිහට අපේ ගෙදරින් තේ උගුරක් බීලා යන එකත් මදි කමක් ද..?'' තාත්තා ඇසුවේ ඈත යන වාහනය දෙස බලාගෙන ය.

''අනේ ඕවා මේ අසරණීට කියලා වැඩක් තියෙනව ද..? මේ ළමයා මොනා කරන්නද ඒවට..'' නිෂාධිගේ මැළවී ගිය මුහුණ දකින අම්මා තුළ ඇතිවන්නේ කණගාටුවකි. ඈ නිෂාධිට සාලයේ සැප පුටුවේ වාඩි වන්නට උපකාර කළා ය.

''අර ළමයි ඊයෙම ටෙලිෆෝන් කරලා අපට කිව්වා දුවගෙ ටිකට් කප්පවා ගෙන ගියයි කියලා..'' තාත්තා කියන්නේ පවිත්‍රලා ගැන විය යුතු ය. ''.. ටිකට් කැපුවා නම් මෙහෙට එක්කගෙන එන්න එපායැ.. රට්ටු හිනස්සන්න හෝටල් ගානෙ නවතින්නෙ නැතිව..''

නිෂාධි කොතැනක ද..? අනුරාධ ඉතා නොයිවසිල්ලෙන් ඒ මේ අත බැලුවේ අවසන් වතාවට ඒ දයාබර මුහුණ යන්තමින් හෝ දැකගන්නා අටියෙනි. කඩිසරව ඒ මේ අත යන ගැහැනුන් මිනිසුන් අතර නිෂාධිගේ රුව සොයා ඔහු ගේ දෑස් වෙහෙණේ ය.

''තාත්තා හිටියෙ හරිම වේදනාවකින්.. ඊයෙ ඉඳන් කල්පනාවෙම තමයි හිටියෙ..'' අම්මා රහසින් කියයි.

''අපට සළකන්නෙ හරියට පිට මිනිස්සුන්ට වගේ.. '' තාත්තාගේ හිතේ වේදනාව තවම පහව ගොස් නැතුවා සේ ය. ''දැන් සෙනසුරාදා ආපහු යන්න තරම් මේ ළමයට සනීපයක් තියෙනවා ද..?''

කුමක් කියන්නදැයි නිෂාධිට නොතේරෙයි. ශාරීරික වේදනාව නම් දරාගෙන යන්නට හැකි ය. එහෙත් මානසික වේදනාව කෙසේ නම් දරා ගන්න ද..?

''මම මිනිහා ආවම කියන්නං එයාට ඕනෙ නං යන්න කියලා.. උඹ මෙහෙට වෙලා හිටපං..''
''එහෙම කියලා හරියන එකක් නැහැ.. දන්නවනෙ මිනිහගෙ හැටි..'' අම්මා තාත්තාට හරස් කපයි.

''අම්මලා මේවට මැදිහත් වෙන්න එපා.. මට යන්න අමාරුවක් නැහැ..'' නිෂාධි කියන්නේ තාත්තා හා දිලීප අතර ගැටුමක් ඇති වනවා දකින්නට ඇති අකැමැත්ත නිසා ය. ''..හැබැයි මං වැඩිකල් එහේ ඉන්නෙ නැහැ.. මං ඉක්මනින් ම ආපහු එනවා..''

''ආපහු..?''

''ඔව් තාත්තා.. මං ආපහු එනවා..''

''ආපහු නොයන්නම..?''

'ඔව්.. ආපහු නොයන්නම..''

තාත්තා කල්පනාවකට වැටෙන සැටි නිෂාධිට පෙනෙයි. ඔහු වචන වලින් නෑසුවද බොහෝ දේ තේරුම් ගන්නට ඇති බව නිසැක ය. එයට එරෙහිව ඔහු එක වචනයක් හෝ නොකීම නිෂාධිගේ සිතට සැනසුමක් ගෙන දුන්නේ ය.

''ඉන්න අමාරුම නං ආපහු එන්න.. '' තාත්තා කීවේ නැගිට මිදුලට බසින අතර ය.

0000000000

බ්‍රහස්පතින්දාත් සිකුරාදාත් අනුරාධ හෝටලයට කතා කර නිෂාධි අමතන්නට කීප වතාවක්ම උත්සාහ කළේ ය. ඒ සෑම විටකම දුරකතනයට ආවේ දිලීප ය.

''සමාවෙන්න සර්.. ඒ රූම් එකට කිසිම කෝල් එකක් එවන්න එපාය කියලා ඕඩර් කරලා තියෙනවා..'' සිකුරාදා සවස අනුරාධ හෝටලයට කතා කළ අවසාන අවස්ථාවේදී දුරකතනය ඇමතූ සේවිකාව කීවා ය.

සෙනසුරාදා වන විට අනුරාධ සිටියේ හිස ගිණිගත්තකු සේ ය. අද රැයේ නිෂාධි තමාගෙන් ඈත්ව යන බව සිහිපත් වන සෑම විටම ඔහුගේ දෑස් කඳුලින් තෙමී ගියේ ය.

''ඔය හැටි කල්පනා කරන්න එපා බං.. මේක ලෝකෙ අවසාන දවස නෙවෙයිනෙ.. අපි එන හැටියකට මුහුණ දෙමු..'' දහවල අනුරාධ හමුවන්නට පැමිණි සුනෙත් කීවේ සිය සගයාගේ වේදනාව තේරුම් ගත් බැවිනි.

''මට තේරෙන්නෙ නැහැ බං මොනා කරන්න ද කියලා..''
''කලබල නොවී හිත කෙළින් තියාගෙන හිටපං''

අනුරාධ සුනෙත් කී දේ නෑසුණා සේ කවුළුවෙන් පිටත අහස දෙස බලා සිටියේ ය. සුනෙත් ඇඳ අසළ පුටුවේ වාඩි වී දෙපා ඇඳ මත තබා ගත්තේ ය.

අනුරාධගේ ජංගම දුරකතනය නාදවෙයි. සුනෙත් එය රැගෙන අනුරාධ අතට දුන්නේ ය.

''අනු...'' දුරකතනය තුළින් ඇසෙන්නේ නිෂාධිගේ දයාබර හඬ නොවේ ද?

''නිෂා.. දෙයියනේ නිෂා ඔයා..''

''කතා කරන්න වෙලාවක් නැහැ රත්තරන්.. මං අද රෑ යනවා.. මට ඔයාට කියලා යන්න එක දෙයක් තියෙකවා.. ලෝකෙ කොයි කොණේ හිටියත් මං ඔයා ළඟට එනවාමයි.. ඒක විතරක් හිතේ තියාගන්න..''

''නිෂා.. මට ඔයා නැතිව ඉන්න බැහැ''

''මටත් බැහැ... ඔයා කලබල වෙන්න එපා කිසි දේකට.. සතුටෙන් ඉන්න.. මං ඔයාට ආදරෙයි.. ඒක කවදාවත් වෙනස් වෙන්නෙ නැහැ.. මං තියන්නං අනු..'' අනුරාධ යමක් කියන්නට පෙර දුරකතනය විසන්ධි වනු ඇසුණි.

*සමාවක් නැති ලොවක*
*නිමාවක් නොවන මග*
*අමාවක් විලස හිඳ*
*සිනාවක් පුදනවද...*

*හිත හීන පොදි බැන්ද*
*මකරන්ද සුව වින්ද*
*ගිරි දුර්ග එඩි බින්ද*
*කවි ගීත පුරනවද ..*

වැහි අන්ධකාරයකින් අහස වැසී යමින් ඇත. ඈතින් අහස ගොරවනු ඇසෙයි. තව ටිකකින් මහා වැස්සක් වසිනු ඇත. මෙය මහා මූසල දවසකැයි අනුරාධට සිතෙයි.

සුනෙත් සිය මිතුරා දෙස බලා සිටියේ අනුකම්පා-වෙනි. ජීවිතයේ කිසි දිනෙක අනුරාධ මේ තරම් සසළව සිටිනු ඔහු දැක නැත. සෑම හැල හැප්පීමකදීම ඔහු එඩිතරව ඒ සියල්ලටම මුහුණ දුන් සැටි සුනෙත් දනියි. ශක්තිමත්ව ජීවිතයට මුහුණ දීම පිළිබඳව සැමට ආදර්ශයක් දුන්නේ ඔහු ය. එහෙත් අද ඔහු අසාමාන්‍ය ලෙස කැළඹීමට පත්ව සිටිනු සුනෙත්ට පෙනෙයි.

''මම එයාපෝට් එකට යනවා..'' අනුරාධ සුනෙත් දෙස එක එල්ලේ බලා කීවේ ය.

පැය තුනකට පමණ කලින් ගුවන් තොටුපළට පැමිණිය යුතු නිසා අනුරාධ කල් ඇතුවම පිටත් වන්නට සිතුවේය. ඔහුට නිෂාධි දැකගන්නා තුරු ඉවසුමක් නැත. දිලීප සිටිද්දී වචනයක් කතා කරන්නට අවස්ථාවක් නොලැබෙන බව නම් විශ්වාසය. එහෙත් මේ අවසාන මොහොතේ ඇය දැක ගන්නට හෝ ලැබේ නම් එයද ප්‍රමාණවත් වේ..

සුනෙත් සමඟ අනුරාධ ගුවන් තොටුපලෙහි පිටත්ව යෑමේ පර්යන්තයට පැමිණියේ දන්නා හඳුනන අයගේ උපකාරය ඇතිව ය.

නිෂාධි කොතැනක ද..? අනුරාධ ඉතා නොයිවසිල්ලෙන් ඒ මේ අත බැලුවේ අවසන් වතාවට ඒ දයාබර මුහුණ යන්තමින් හෝ දැකගන්නා අටියෙනි. කඩිසරව ඒ මේ අත යන ගැහැනුන් මිනිසුන් අතර නිෂාධිගේ රුව සොයා ඔහු ගේ දෑස් වෙහෙණේ ය. තම හදවත වේගයෙන් ගැහෙන ආකාරය පවා ඔහුට දැනුණි. ඔහු අසරණ ලෙස සුනෙත් දෙස බැලුවේ ය.

සුනෙත් සිය දකුණත මිතුරාගේ උරහිස මත තැබුවේ ය.

*ලබන කලාපයට*